දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/3/9/2024

ඔබේ අංකය / உமது இல. / Your No. HSC/TRA/DEN/APPEALS/12/18/2023

දිනය / திகதி / Date 2024.07. 26

**ලේකම්,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**<u>දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ ඔබගේ සමාංක හා 2024.02.14 හා 2024.06.20 දිනැති ලිපි හා බැඳේ.

02. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බැලීමෙන් පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබාදුන් තීරණ <u>www.psc.gov.lk</u> දරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කර ඇත.

03. ඒ අනුව,රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති සියලු ස්ථාන මාරු වහාම ක්‍රියාත්මක කරන ලෙසත්, නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙසත් කරුණිකව දන්වමි. රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බැවින් එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

05. 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා සිටින සියලුම නිලධාරීන් නියමිත දිනයේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන වර්තමාන සේවා ස්ථානවලින් මුදා හැරීමට කටයුතු කිරීම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන අතර, එය නිවැරදිව සිදු වන්නේද යන්න පිළිබඳව පුළුල් අධ්‍යයනයක් හා පසු විපරමක් සිදු කරන ලෙසද ඔබ වෙත දන්වා සිටිමි.

06. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257 (V) වගන්තිය අනුව, සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා තනතුර අතහැරයාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

07. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිම.

Ndoy

**ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත : ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

## 2023 දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ

| අනු අංකය | නම | තනතුර හා පන්තිය | වර්තමාන සේවා ස්ථානය | ස්ථානමාරු ලැබූ නව සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 1 | දන්ත ශල්‍ය වෛද්‍ය එස්.ඒ.එස්. වීරසිංහ මිය | දන්ත ශල්‍ය වෛද්‍ය<br>I ශ්‍රේණිය | ශික්ෂණ රෝහල - මහනුවර (HO OMF) | ගල්ගමුව මූලික රෝහල | ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 2 | දන්ත ශල්‍ය වෛද්‍ය යූ.එස්.පී. කේ. උඩුවෙල මහතා | දන්ත ශල්‍ය වෛද්‍ය<br>II ශ්‍රේණිය | ශික්ෂණ රෝහල - මහනුවර (SHO OMF) | ප්‍රජා දන්ත සායනය - සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හසලක | ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම |
| 3 | දන්ත ශල්‍ය වෛද්‍ය එච්.ඒ.එම්. රංගිකා මිය | දන්ත ශල්‍ය වෛද්‍ය<br>II ශ්‍රේණිය | මුඛ සෞඛ්‍ය ආයතනය - මහරගම (Restorative Unit) | තෙප්පනාව ප්‍රාදේශීය රෝහල | I. ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම<br>II. මහරගම මුඛ සෞඛ්‍ය ආයතනය වෙත අවුරුදු 1 ක සහන කාල සීමාවකට නිලධාරියා අනුයුක්ත කිරීම<br>III. 2025 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කරන ලෙස නිලධාරියාට දැනුම් දීම. |
| 4 | දන්ත ශල්‍ය වෛද්‍ය ජී.පී.ඩී. ගයාෂා මිය | දන්ත ශල්‍ය වෛද්‍ය<br>II ශ්‍රේණිය | ජාතික දන්ත වෛද්‍ය ශික්ෂණ රෝහල (HO OMF) | කිරිපෝරුව ප්‍රාදේශීය රෝහල | I. ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම<br>II. ජාතික දන්ත සෞඛ්‍ය ආයතනය වෙත අවුරුදු 1ක සහන කාල සීමාවකට නිලධාරියා අනුයුක්ත කිරීම<br>III. 2025 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කරන ලෙස නිලධාරියාට දැනුම් දීම. |